**මාතර මහා නගර සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතර මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික අංශ ව්‍යාපෘති සඳහා 1995 වර්ෂයේ දී සපයන ලද රු.89,373,461 ක් වූ ණය මුදලෙන් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 25 දිනට හිඟ ණය ශේෂය හා පොළිය රු.40,504,466 ක් හා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.316,149 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | බේරුම්කරණයෙන් පසු ගෙවිය යුතු මුළු ණය මුදල ගිණුම්ගත කර ගෙවීමට කටයුතු කරන බව හා උසාවි දඩ නිරාකරණය කර ගැනීම සඳහා නිශ්චිතවම නඩු පවරන ලද නඩු ඒකක හා දඩ මුදල් පිළිබඳව නව නඩු ලේඛණයක් පවත්වාගෙන යාම ආරම්භ කර ඇති බව. | ගෙවිය යුතු මුළු ණය මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.10,460,551 ක් හා කොම්පෝස්ට් අංගනයේ පොලිතීන් අලෙවියෙන් ලැබිය යුතු මුදල රු.434,220 ක් වැඩිපුර ගිණුම්ගතකර තිබුණි. | මුද්දර ගාස්තු තව දුරටත් අයවිය යුතු බැවින්, එම ආදායම ණයගැති ලේඛණයෙන් ඉවත් කළ නොහැකි බව හා ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී VAT බදු පාලන ගිණුමක් පවත්වා ගෙන නොගොස් අයකළ හා අයවිය යුතු රු.9,419,383 ක් සේවා ගාස්තු යටතේ ගිණුම් ගත කර තිබූ අතර ගෙවන ලද හා ගෙවිය යුතු VAT බදු රු.16,453,706 ක් තැන්පතු ගිණුම යටතේ ගිණුම්ගත කර තිබීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී වැට් සඳහා අයවිය යුතු මුදල වෙනුවෙන් සේවා ගාස්තු යටතේ වෙනම ලෙජර් ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | VAT බදු පාලන ගිණුමක් මගින් හා ලැබියයුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2021 වර්ෂය වෙනුවෙන් ලද මුද්දර ගාස්තු සඳහා ඌන ප්‍රතිපාදන වෙන්කිරීම රු.11,411,957 ක් වැඩියෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. | ණයගැති ලේඛණයේ සටහන් කිරිමේදී සිදු වූ දෝෂයක් බැවින් සමස්ථ ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයට බලපෑමක් සිදුවී නොමැති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | රු.963,681 ක් වූ ඉන්වෙන්ට්‍රි අයිතම 1,291 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ප්‍රායෝගිකත්වය සලකා ලේඛනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කර්මාන්ත 07 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ණයහිමි ශේෂය රු.2,572,928 ක් වුවද ලිපිගොනු අනුව එය රු.156,764 ක් වීමෙන් රු.2,416,164 ක් ලෙස හා කර්මාන්ත 09 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ණයගැති ශේෂය රු.3,106,898 ක් වුවද ලිපිගොනු අනුව එය රු.188,015 ක් වීමෙන් රු.2,918,883 ක් ලෙස වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | එක් කර්මාන්තයකට අදාළ ණයහිමි ශේෂය හා කර්මාන්ත 02 කට අදාල ණයගැති ශේෂ වැඩිපුර ගණනය වී ඇති බව. | නිවැරදිව කර්මාන්ත ණයහිමි හා ණයගැති ශේෂයන් ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂයට අදාළ එකතුව රු.4,126,435 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත්, වැරදීමකින් වර්ෂයේ වියදමට ගැලපීම් කර ඇති බව. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | ගෙවිය යුතු වියදම් රු.241,460 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු වියදම් සඳහා නිවැරදිව ප්‍රතිපාදන ඇති කළ යුතුය. |
| (එ) | සූර්ය පැනලයෙන් නිපදවන අතිරික්ත විදුලිය වෙනුවෙන් ලද රු.306,156 ක මුදල ණයගැති ගිණුමට හර කිරීම නිසා ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අය ශීර්ෂයට බැර කළ යුතු වුවත්, ණයගැතියන්ට බැර කර ඇති බව. | සමාලෝචිත වර්ෂයේ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සභාවේ සේවයේ කළ විශ්‍රාමික නිලධාරීන් වෙනුවෙන් පළාත් පාලන අරමුදලට ගෙවිය යුතු රු.48,734,760 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. | 2018 ඔක්තෝබර් මාසයේ සිට ලේඛන තහවුරු කර ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 13 කට අදාල ශේෂයන් හා ඊට අදාළ උපලේඛන/උපයෝගී ලේඛණවල දැක්වෙන ශේෂ අතර රු.18,344,893 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.223,408,858 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ.571 | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 02 ඉක්ම වූ එකතු වටිනාකම රු.5,268,198 ක් වූ තැන්පතු ශේෂ 809 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.143,093,918 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 162,479,763 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 36,775,793 | 43,920,938 | 49,573,197 | 61,391,920 | 36,726,576 | 42,135,018 | 36,096,681 | 67,044,179 |
| කුලී | 30,939,750 | 37,538,384 | 43,587,093 | 84,530,685 | 28,469,950 | 29,152,465 | 13,395,072 | 90,579,394 |
| බලපත්‍ර ගාස්තු | 23,250,000 | 32,849,221 | 32,221,121 | 12,419,057 | 25,241,000 | 23,045,801 | 36,629,472 | 11,790,957 |
| වෙනත් ආදායම් | 171,660,800 | 181,702,095 | 189,212,113 | 26,587,323 | 66,224,500 | 91,570,343 | 67,246,462 | 34,097,341 |
| එකතුව | 262,626,343 | 296,010,638 | 314,593,524 | 184,928,985 | 156,662,026 | 185,903,627 | 153,367,687 | 203,511,871 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.64,208,469 ක් වූ අතර, වරිපනම් ඒකක 34549 කට අදාළව වර්ෂය තුළදී බිල්කිරීම් රු.34,095,896 ක් සමඟ රු.98,304,365 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.36,912,445 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.61,391,920 ක හිඟ ශේෂයක් පැවතුණි. | අදාළ පර්ශවයන් වෙත ලිඛිතව දන්වා යවමින් හිඟ වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතුය. |
| (ආ) | හිඟ වරිපනම් බදු අය කිරීම වෙනුවෙන් නිලධාරීන් 10 දෙනෙකුට 2018 සිට පසුගිය වර්ෂය දක්වා කාලසීමාව තුළ රු.1,955,196 ක කොමිස් මුදලක් ගෙවා තිබුණි. වාර්ෂිකව බිල් කරනු ලබන වරිපනම් බදු අය කර ගැනීමට සභාවේ වගකිව යුතු නිලධාරීන් කටයුතු නොකර වාර්ෂික හිඟ ආදායමට එකතුවන හිඟ වරිපනම් ආදායම වැඩි වී ඇති අතර එම හිඟය 2018 සිට පසුගිය වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාලව වාර්ෂිකව සියයට 1 ත් සියයට 5 ත් අතර ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි. | ආදායම් රැස් කිරීම නිසි අධීක්ෂණයෙන් යුක්තව කර ඇති බවත්, ඒ අනුව හිඟ ආදායම් අයකර ගැනීමට හා එහි ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි වී ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 639 න් 591 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 358 දෙනෙකුගෙන් රු.61,597,767 ක කඩ කුලී අයවීමට තිබුණි. | අදහස් දන්වා නැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක ද.ප.පා/ප.පා.කො/ 2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 04 වන හා 05 වන ඡේද ප්‍රකාරව පිළිවෙළින් හුණුකොටුව නව වෙළෙඳ සංකීර්ණයට අයත් කඩ කාමර 04 ක් හා කඩ අල්ලි 03 කට අදාළව කඩ කාමර බදු දීමේදී අය කළ යුතු රු.3,091,000 ක් වූ එක්වන් මුදල් අය කර ගෙන නොතිබුණ අතර හුණුකොටුව පොදු වෙළෙඳපොල සංකීර්ණයෙහි බදු දී තිබූ කඩ කාමර 04 ක් හා කඩ අල්ලි 04 කට අදාළව බදුකරුවන් සමඟ බදු ගිවිසුම්වලට ද එළඹ නොතිබුණි. | කඩ කාමර 03 ක සහ කඩ අල්ලි 02 ක එක්වන් මුදල් රු.2,631,000 ක් අය වී ඇති බව හා කඩ කාමර 03 ක සහ කඩ අල්ලි 02 ක ගිවිසුම් ගත වී ඇති බව, එක් අල්ලියක බදුකරුට ගිවිසුම්ගත වන ලෙස දන්වා ඇති බව, ඉතිරි අල්ලියට එක්වන් මුදල් ගෙවා අවසන් කිරීමට දැනුම් දීම සිදු කර ඇති බව, එක්වන් මුදල් නොගෙවූ කඩ කාමරය සභාව වෙත පවරා ගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | වල්ගම පොදු වෙළෙඳපොල කඩ කාමර සංකීර්ණ ගොඩනැගිල්ල මහජනයාට ප්‍රදර්ශනය වන ආකාරයට සැලසුම් කර නොතිබීම නිසා මහජනතාව වෙළෙඳපලට පැමිණීම ඉතා දුර්වල මට්ටමක පැවතීම හේතු කරගෙන කඩ කාමර හා කඩ අල්ලි ලබා ගෙන තිබූ වෙළෙඳුන් 13 දෙනෙකු විසින් කරන ලද තැන්පතු මුදල්, එක්වන් මුදල් හා මාසික කඩ කුලී මුදල් වූ රු. 2,858,410 ක් ආපසු බදුකරුවන්ට ගෙවීමට සභාවට සිදුව තිබුණි. | සැලසුමේ අසාර්ථකත්වය මත කඩ කාමර වැසී යාමෙන්, වසා තිබූ කාලයට අදාළව බිල් කරන ලද කඩ කුලී හා එක්වන් මුදල් ආපසු ගෙවන ලද බව. | සභාව සතු දේපළවලින් ආදායම් ඉපයීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | වාර්ෂික සමීක්ෂණයෙන් හඳුනා ගෙන නොතිබූ දීප ව්‍යාප්ත සමාගම් විසින් හා වෙළෙඳසැල් හා ව්‍යාපාර ආයතන විසින් ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු පිළිවෙළින් 61 කින් හා 164 කින් ලැබිය යුතු රු.2,037,602 ක ආදායමක් අය කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (උ) | සමාගම් විසින් හා වෙළෙඳසැල් හා ව්‍යාපාර ආයතන විසින් ප්‍රදර්ශනය කරමින් පැවැති දැන්වීම් පුවරු පිළිවෙළින් 29 ක හා 30 ක වර්ග අඩි ප්‍රමාණය නිසි පරිදි මැනුම් කර නොතිබීම හේතුවෙන් රු.532,125 ක ආදායමක් අඩුවෙන් බිල් කිරීම නිසා එම වටිනාකම සභාවට අය වී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඌ) | මාතර මහා නගර සභාව මඟින් පාලනය වන උයන්වත්ත පාපන්දු ක්‍රීඩාංගනය ආශ්‍රිතව අනවසරයෙන් ඉදිකළ දික් අඩි 25 ක දැන්වීම් පුවරුව සම්බන්ධයෙන් සභා සම්මුතිය ප්‍රකාරව අයකළ යුතු අවම බිම් බදු කුළිය දික් අඩියක් සඳහා මාසිකව රු.2,500 විය. ඒ අනුව මාසයකට රු.2,500 බැගින් දික් අඩි 25 ක් සඳහා මාසික බිම් බදු කුලිය රු.62,500 ක් ලෙස 2019 ජුලි 09 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා අයකළ යුතු අවම බිම් කුලිය රු.3,375,000 ක් වුවත් සභාව විසින් රු.495,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් උසාවි දඩ රු.445,101 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.141,307,932 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම සෑම මසකම කොටස් වශයෙන් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බවත්, සත්‍ය වශයෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල රු.195,001 ක් බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අගෝස්තු 11 දින කටයුතු ආරම්භ කළ කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම නොකිරීම සම්බන්ධයෙන් එහි ඉදිකිරීම් කටයුතු පැවරී ඇති සමාගමට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, වසර 25 ක කාලයකට පවරා තිබූ අක්කර 05 ක භූමි භාගය සඳහා මාසික බදු කුලියක් අය කර ගැනීමටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන තත්ත්වයක් යටතේ එම ඉඩමේ තාවකාලික භුක්තිය අහෝසි කිරීමටත් සභාව කටයුතු කර නොතිබුණි. | බයෝග්‍රීන් සයිකල් පුද්ගලික සමාගමේ මූල්‍යමය දායකත්වය යටතේ කොම්පෝස්ට් අංගනයක් කඩිනමින් ඉදිකර ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ මැදිහත්වීම ලබා ගැනීමටත්, මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කාල වකවානු සහිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර මධ්‍යම පරිසර අධිකාරිය සහ මාතර මහා නගර සභාව වෙත යොමු කිරීමටත්, කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුවෙන් මාතර මහා නගර සභාවට සිදු වී ඇති මූල්‍යමය අලාභය අයකර ගැනීම සඳහා සමාගමට එරෙහිව එන්තරවාසියක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත්. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | නිර්මාණය වෙමින් පවතින විශාල කසළ කන්ද හේතු කර ගෙන ඇති වී තිබෙන පාරිසරික හා සෞඛ්‍යමය ගැටළුකාරී තත්ත්වය පාලනය කිරීම සඳහා කෙටිකාලීන විසඳුමක් ලෙස කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍ර යොදවා පස්වලින් කසළ යට කිරීම සඳහා 2018 මැයි සිට සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.මිලියන 57.72 ක කුලියක් සහා | අධිකරණ නියෝගය පරිදි මහජන පීඩාවක් ඇති නොවන ආකාරයට කසළ අංගනයේ කටයුතු පවත්වාගෙන යා යුතු බැවින් කසළ ඈතට තල්ලු කිරීම හා ඒවා පස් දමා වසා දැමීමට සිදු වූ බවත්, සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය භාවිතා කර එය සිදු කළ නොහැකි වීම නිසා කුලී පදනම මත PC 200 එක්ස්කැවේටර් යන්ත්‍රයක් සේවයේ යොදවා ගත් බවත්, මේ | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

| | |
|---|---|
| අරමුදලින් ගෙවා තිබුණ ද ඒ මගින් ද ස්ථිර විසඳුමක් ලැබී නොතිබුණි. | වනවිට ඒ වෙනුවෙන් අධික මුදලක් ගෙවීමට සිදු වී ඇති බැවින් රු. මි. 22 භාවිතා කර නව එක්ස්කැවේටර් යන්ත්‍රයක් මිලදී ගැනීමට තීරණය කරන ලද නමුත්, කොටවිල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙනත් ව්‍යාපෘතියක් සඳහා ලබා දීම සඳහා ද මේ වන විට කටයුතු කරමින් සිටින බැවින් මහා නගර සභාවට එවැනි යන්ත්‍රයක් මිලදී ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ද අවිනිශ්චිතතාවයක් පවතින බවත්, කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීමෙන් පසුව මෙම යන්ත්‍රය මගින් ලබාගන්නා සේවය අවසන් කිරීමට අපේක්ෂිත බව. |

## 3.2 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.24,952,695 ක් වැයකර බැල්කනි හා වැරන්ඩා සහිත රථවාහන නැවතුම් ස්ථානය ඇතුළත්ව චතුරශ්‍රාකාර හැඩයෙන් (Box type) ඉදි කර තිබූ නාගරික කොමසාරිස් නිල නිවාසයේ නිමාවට බලපෑමක් සිදු වන පරිදි රු.360,000 ක් වැය කර කැනපි වහළක් ඉදි කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිසි ක්‍රමවේදයකට අනුව ඉදිකිරීම සිදු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී සභාව විසින් රු.2,013,976 ක වියදමක් දරා ස්ථාපිත කර තිබූ Nekfa LGS මෘදුකාංගය 2017 වර්ෂයේ සිට පසුගිය වර්ෂය දක්වා වාර්ෂික ගාස්තු වශයෙන් රු.696,750 ක වියදමක් දරා තිබුණද මෙම මෘදුකාංගය මගින් මිශ්‍ර ආදායම් අංශයේ ආදායම් වාර්තා නිසි පරිදි ලබා ගැනීමට නොහැකිවී තිබූ අතර මෙම මෘදුකාංගයට පිවිසීම සීමාකර අභ්‍යන්තර පාලන ක්‍රමයක්ද ස්ථාපිත කර නොතිබුණි. තවද 2017 වර්ෂයේ සිට මෙම මෘදුකාංගයට ඇතුලත් කරන ලද දත්ත මකා දැමීම පිළිබඳ විස්තරද | පිළිතුරු සකස් කරමින් පවතින බව. | නියමිත පරිදි මෘදුකාංගය ක්‍රියාත්මක කළ යුතු අතර විගණනයට අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විගණනයට මේ දක්වා ලබා දීමට කටයුතු කර නොතිබුණු බැවින් සභාවට අය විය යුතු ආදායම නිසි පරිදි අය කර ගැනීමටත් නොහැකි වී තිබුණි. | | |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) ප්‍රකාරව සියලුම විගණන විමසුම් සඳහා නිශ්චිත කාලයක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ/ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වුවද, මාතර මහා නගර සභාව වෙත 2022 ඔක්තෝබර් මස සිට 2024 අප්‍රේල් මස දක්වා ඉදිරිපත් කර තිබූ විගණන විමසුම් හා නැවත විමසුම් කිරීම් 09 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණ අතර 2024 මැයි 20 දින වන විටත් වැඩ කරන දින 366 ත් 11 ත් අතර ප්‍රමාදයන් ඇති වී තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7 හා 8 හි විධි විධාන ප්‍රකාරව විගණකාධිපති වෙත පවරා ඇති කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා මාතර මහා නගර සභාව වෙත 2023 සැප්තැම්බර් මස සිට 2024 පෙබරවාරි මස දක්වා යොමු කළ තොරතුරු කැඳවීම් 6 කට අදාළව තොරතුරු විගණනය වෙත යොමු කර නොතිබුණු අතර 2023 මැයි 20 දින වන විට වැඩ කරන දින 144 ත් 43 ත් අතර ප්‍රමාද කාලයක් ගත වී තිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. | පනත විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2009 ත් 2013 වර්ෂයත් අතර කාල පරිච්ඡේදයට අයත් මුද්දර ගාස්තු රු.3,422,895 ක් හා දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබිය යුතු විනෝද බදු රු.4,599,519 ක අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය අය කර ගැනීම සම්බන්ධයෙන් සභාව ගත හැකි සියළුම ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | සභාව වෙත අය විය යුතු මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඉ) | ආසියානු සංවර්ධන බැංකුව විසින් නාගරික අංශ ව්‍යාපෘතිය යටතේ මාතර මහා නගර සභාවට ලබා දී තිබූ රුපියල් මිලියන 154.194 ක ණය මුදල හා හිඟ පොලිය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කටයුතු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මාතර මහා නගර සභාවට අය විය යුතු රු.9,790,824 ක් වූ හිඟ තානායම් කුලී ශේෂය සභාව විසින් ගෙවිය යුතු ණය වාරික හා පොලී මුදලට හිලව් කර, ඉතිරි ණය මුදල ගෙවීම පිළිබඳ සාකච්ඡාවන් තවදුරටත් සිදුකරමින් පවතින බවත්, මෙම ගණුදෙනුව බේරුම්කරණයෙන් පසු ගෙවිය යුතු මුළු ණය මුදල ගිණුම්ගත කර ගෙවීමට කටයුතු සිදු කරන බව | බාහිර වගකීම් කඩිනමින් නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2007-2022 වර්ෂ අතර කාලසීමාව තුළ ගබඩාවට ලැබී තිබූ අයිතම 20 කට අයත් ඒකක 172 ක් විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 14 දින වන විට වර්ෂ 01 ත් වර්ෂ 16 මාස 07 ත් අතර කාලසීමාවක් තිස්සේ නිකුත් නොකර ගබඩාවේ පැවතුණි. ඉන් අයිතම 15 කට අදාළ වටිනාකම රු.1,782,100 ක් වූ අතර අයිතම 5 ක වටිනාකම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පරිගණක දත්ත පද්ධතියක් මගින් ගබඩා තොග පාලන ක්‍රියාවලියට අදාළ මෘදුකාංගය සඳහා දත්ත ඇතුලත් කිරීම සිදුකරනු ලබන බවත්, එම පද්ධතිය නිසි පරිදි ක්‍රියාකාරී තත්ත්වයට පත්වීම තුළින් ඉදිරියේදී මෙම දුර්වලතා වළක්වා ගැනීමට හැකි වනු ඇති බව. | තොග පාලනය නිසි පරිදි පවත්වා ගත යුතුය. |
| (උ) | 2019-2023 කාල පරිච්ඡේදය තුළ ගබඩාවට ලැබී තිබූ රු.2,821,200 ක් වටිනා ටයර් හා ටියුබ් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 15 දින වන විටත් ගබඩාවේ පැවතුණි. | පරිගණක දත්ත පද්ධතියක් මගින් ගබඩා තොග පාලන ක්‍රියාවලියට අදාළ මෘදුකාංගය සඳහා දත්ත ඇතුලත් කිරීම සිදුකරනු ලබන බවත්, එම පද්ධතිය නිසි පරිදි ක්‍රියාකාරී තත්ත්වයට පත්වීම තුළින් ඉදිරියේදී මෙම දුර්වලතා වළක්වා ගැනීමට හැකි වනු ඇති බව. | අවශ්‍යතාවය පිළිබඳ සලකා බලා මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| (ඌ) | අංක LF-1132 දරන ISSUZU ආපදා මැදිහත්වීමේ රථය 2012 නොවැම්බර් 28 දින අනතුරට ලක් වී තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 104(3) හා 104(4) පරීක්ෂණයක් සිදු කර එහි වාර්තා හා රථය අලුත්වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු රු.2,529,829 ක ඇස්තමේන්තුවට අදාල අලුත්වැඩියා වියදම, රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කර තිබූ මුදල හා අලුත්වැඩියාවෙන් පසු මෝටර් රථ පරීක්ෂක හා යාන්ත්‍රික ඉංජිනේරු ලබා දී තිබූ නිර්දේශ සහිත වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පිළිතුර පිළිගන්නා බවත්, අදාළ තොරතුරු ගොනුවේ නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, වාහන අනතුරට අදාළ ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (එ) | ගිනි නිවීමේ කටයුතු සඳහා යොදාගනු ලබන ආපදා මැදිහත්වීමේ රථය වසර 1 ½ කට ආසන්න කාලයක් අක්‍රීයව පවතින අතර ගිනි නිවීමේ කටයුතු සඳහා දැනට යොදා ගනු ලබන LF-7484 රථය සුළං හා සුනාමි වැනි ආපදා අවස්ථාවලින් බැහැරව යම් යම් පුද්ගලයින්ගේ අවශ්‍යතා මත හා වෙනත් බාහිර කටයුතු සඳහා යොදා ගනු ලබන බව නියැදි විගණන පරීක්ෂාවේදී දක්නට ලැබුණි. | ගිනි ගැනීම් නිතර සිදු නොවන බැවින්, එම රථ හා කාර්යය මණ්ඩලය වෙනත් කාර්යයන් සඳහා යොදවා ගැනීම මහජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීමට ඉවහල්වන බව. | ගිනි නිවන ඒකකය ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගත යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 01 දින සිට සැප්තැම්බර් 12 කාලපරිච්ඡේදය තුළ සභාව සතු වාහන හා යන්ත්‍ර උපකරණ 03 කට රු.725,688 ක් වටිනා ඉන්ධන ලීටර් 1,985 ක් ලබා දී තිබුණ ද | ඉන්ධන දහනය සැළකිල්ලට ගෙන කාර්යක්ෂමතා අගයක් ලබා ගෙන ඒ අනුව දෛනික | ඉන්ධන තුලනය නිසි පරිදි සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මයිලෝ මීටරය අක්‍රීය වීම හේතුවෙන් ඉන්ධන තුලනය නිවැරදිව සිදු කළ බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් තුලනය කිරීම සිදු කරන බව. | |
| (ඔ) | කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලය ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ දී රු.759,550 ක වටිනාකමකින් යුත් උපකරණ මිලදී ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 17 දින වන විට මිලදී ගෙන තිබූ සර්වර් පරිගණකය ක්‍රියා විරහිත වීම නිසා වැඩ සටහනේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකිව තිබුණි. | ඉදිරියේදී server rack එකක් සහ 2kv online ups යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත්, පුස්තකාල ස්වයංක්‍රීය ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට සිදුකරගෙන යාම තුළින් කාර්යක්ෂම හා ඵලදායී පුස්තකාල සේවාවක් ලබා දීමට කටයුතු කරන බව. | නවීන තාක්ෂණය යොදා ගනිමින්, පුස්තකාල සේවය කාර්යක්ෂමව හා ඵලදායිව ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ ජූනි 30 දක්වා ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධන බලපත්‍ර 3431 ක් නිකුත් කර තිබූ අතර ඒ සඳහා අනුකූලතා සහතික 372 ක් නිකුත් කර තිබුණි. 2016 වර්ෂයේදී සංවර්ධන බලපත්‍ර ලබාදුන් 607 න් මහා නගර සභාව විසින් ඉදිරිපත් කර තිබූ අනුකූලතා සහතික ලබාදීමේ ප්‍රගති වාර්තාවට අනුව අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි සංඛ්‍යාව 503 ක්ද අනුමත සැලැස්මට පටහැනිව ඉදිකිරීම හා විවිධ කාරණා හේතුවෙන් ගොඩනැගිලි 121 කට අනුකූලතා සහතික ලබාදීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වූයෙන් සංවර්ධන බලපත්‍ර ලබාදීමෙන් පසු අනුමත සැලැස්ම ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකර තිබේද යන්න පිළිබඳ පසු විපරම් කිරීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | 2016 වර්ෂයේ අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් වසර 05 ඉක්මවා ඇති බැවින්, නැවත සැලසුම් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු අනුකූලතා සහතිකය ලබා ගත යුතු වන බව නාගරික සංවර්ධන අධිකාරිය විසින් දන්වා ඇති බවත්, මේ වන විට 2016 වර්ෂයට අදාල ඉතිරි ගොඩනැගිලි අයදුම්පත් ගොනු ද තාක්ෂණ නිලධාරීන් විසින් පරීක්ෂා කරමින් පවතින බව. | අනුකූලතා සහතික ලබා දීමට කටයුතු කළ යුතුය. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතර මහා නගර සභාව සතු වෙරළ තීර භූමියේ “Spicy Street by Mind Spark Food Festival” සැණකෙලිය සඳහා භූමිය තාවකාලික බදු දීමේ දී සභාවට අයවිය යුතු රු.335,543 ක් අය කර ගැනීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සභාවට අයවිය යුතු බදු කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිසි සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමෙන් තොරව සිදු කර තිබූ ඉදිකිරීම් 04 කට 2010-2030 මාතර නාගරික සංවර්ධන බලප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මෙහි සැලසුම හා ගොඩනැගිලි රෙගුලාසි ඇතුළත් 11 වන වෙළුමෙහි V වන උපලේඛණය ප්‍රකාරව කටයුතු කර රු.564,086 ක ගාස්තු අය කර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු සැලසුම් කමිටුව තීරණ පරිදි ක්‍රියා කරන බව | සංවර්ධන සැලැස්මෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා අවස්ථා 07ක දී වීථි පහන් කට්ටල, විදුලි බුබුළු හා අනෙකුත් උපාංග ඒකක 2,235 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,813,450 ක් වැය කර තිබූ අතර රු.1,614,100 ක් වටිනා උපකරණ විදුලි කාර්මික හා වැඩ ක්ෂේත්‍ර පරිපාලක වෙත නිකුත් කර තිබූ නමුත් වීථි පහන් අංක කර නොතිබීම, නඩත්තු කටයුතු සඳහා ගබඩාවෙන් ලබා ගෙන තිබූ වීථි පහන් කට්ටල, විදුලි බුබුළු හා අනෙකුත් උපාංග ලේඛණගත කර නොතිබීම, දෛනික වීථි පහන් නඩත්තු ලේඛණය නිවැරදිව පවත්වාගෙන නොයාම, වීථි පහන් නඩත්තුව සම්බන්ධව පැමිණිලි වාර්තා කිරීම සඳහා විධිමත් ලේඛණ පවත්වා ගෙන නොතිබීම, දැවී ගිය විදුලි බල්බ නැවත ගබඩාවට භාරදීමේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හා වීථි පහන් නඩත්තු කටයුතු සඳහා යොදා ගනු ලබන අංක 50-4213 හා HF – 4422 දරන වාහන 02 හි ධාවන සටහන් හා දෛනික වීථිපහන් නඩත්තු උපලේඛණ සමඟ පරීක්ෂාවේ දී අසමානතා පැවතීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | දැනට වීථි පහන් කණු අංක කිරීම සිදු කරමින් පවතින බැවින් ඉදිරියේදී ගබඩාවෙන් වීථිපහන් ලබා ගන්නා විට අංක කර ලබා ගැනීමට කටයුතු කරන බවත්, නඩත්තු කටයුතු සඳහා ගබඩාවෙන් ලබාගන්නා ලද වීථිපහන් උපකරණ දැනට ලේඛනගත කර ඇති බවත්, ෙදෛනික වීථි පහන් නඩත්තු ලේඛනය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | වීථි පහන් නඩත්තු කටයුතු විධිමත් පරිදි සිදු කළ යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලින් බැහැරව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සංගමයේ වාර්ෂික සම්මේලනයට සහභාගී වීම සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලැස්වීම වෙනුවෙන් පසුගිය හා සමාලෝචිත වර්ෂයන්හිදී රු.920,600 ක් බාහිර පාර්ශවයක් වෙත ගෙවා තිබුණි. | දකුණු පළාත් ආණ්ඩුකාරවර විසින් ලබා දී තිබූ අනුමැතිය මත පදනම්ව කටයුතු කර ඇති බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විවිධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් මාර්ගවල ආලේප කිරීමට සහ ප්‍රීමික්ස් නිෂ්පාදනයට නුසුදුසු 80/100 ලීටර් 180 තාර බැරල් 10 ක් 2023 ජුලි 11 දින රු.362,500 ක් වැය | අදහස් දක්වා නොමැත. | නිසි ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ මිලදී ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබූ අතර රසායනාගාර පරීක්ෂාවේදී එම තාරවල Penetration 62 ක් වූයෙන් මිලදී ගත් තාර නියමිත ප්‍රමිතියෙන් යුක්ත නොවූ බවට වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | |
| (ඇ) | 2022 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 13 දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රීමික්ස් සකස් කිරීම සඳහා රු.692,823 ක් වටිනා තාර,¼ චිප්ස් ගල්, වැලි සහ රු.120,820 ක් වටිනා භූමිතෙල් ලීටර් 690 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රීමික්ස් ඝන මීටරයක් නිෂ්පාදනය කිරීමට භාවිතා කිරීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රමිතගත කර තිබෙන තාර ප්‍රමාණයට වඩා වැඩියෙන් භාවිතා කර තිබූ අතර ඇතැම් ද්‍රව්‍ය අඩුවෙන් ද, ½" චිප්ස් ගල් වෙනුවට ¼" චිප්ස් ගල් ද භාවිතා කර තිබුණි. කාලපරිච්ඡේදය තුළ සකස් කරන ලද ප්‍රීමික්ස් ප්‍රමාණයන් පිළිබඳව වාර්තාද මහා නගර සභාව සතුව නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රමිතිගත ප්‍රමාණයට ද්‍රව්‍ය භාවිතා කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජනවාරි 01 දින සිට සමාලෝචිත වර්ෂයේ ජුනි 26 දින දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 24 ක දී රු.1,019,000 ක් වැය කර පෞද්ගලික ආයතනයක් වෙතින් වැලි කියුබ් 37 ක් මිලදී ගෙන තිබූ අතර අවශ්‍ය වැලි ප්‍රමාණයන් දළ වශයෙන් ඇස්තමේන්තුගත නොකිරීම, රහස්‍යභාවය රැකෙන පරිදි මිල ගණන් ලබා ගෙන නොතිබීම, තොග මිල ගණන් හා මිල වට්ටම් ලබා ගැනීමට කටයුතු නොකිරීම, දිස්ත්‍රික් මිල කමිටුවේ මිලගණන්වලට වඩා වැඩි මිලකට අනුමැතියකින් තොරව වැලි කියුබ් 34 ක් මිලදී ගැනීමට රු.264,800 ක් වැඩිපුර ගෙවීම,2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව නැවත ඇනවුම් කිරීම,ප්‍රමිතියෙන් යුක්ත බවට යෝග්‍යතා වාර්තා ලබා නොගැනීම, වැලි තොග ලැබුණු විගසම තොග ලැබීම් පත්‍ර (Stock Received Note) පිළියෙල නොකිරීම හා බින් කාඩ් පත්‍රයේ ඇතුලත් නොකිරීම, මිලදී ගත් වැලි අවිධිමත්ව නිකුත් කිරීම හා වැලි තොග ඌනතාවයක් පැවතීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. | මේ වන විට මහ නගර සභාවේ වැලි සැපයුම්කාර ආයතනය ලෙස සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව පිළිගෙන ඇති බවත්,වැලි තොගය ඇණවුම් කර ලද පසු ඉන් ලබා ගත් සාම්පල පළාත් ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ රසායනාගාරය වෙත යොමු කර නිසි ප්‍රමිතියෙන් යුක්ත බවට සහතික වූ පසු ගෙවීම් කිරීමටත්, නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවේ නම් නැවත රැගෙන යා යුතු බවට මිල ගණන් කැඳවීමේදී අදාළ ආයතනය දැනුවත් කර ඇති බවත්, නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පවත්වා ගෙන යන ලේඛනයක් මඟින් අදාල කර්මාන්ත සඳහා වැලි නිකුත් කිරීමටත් පියවර ගෙන ඇති බව. | විධිමත් ක්‍රමවේදයකට අනුව නිසි ප්‍රමිතියෙන් යුතු වැලි මිලදී ගෙන නිකුත් කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් නිල නිවාසය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු වෙත අදියර දෙකක් යටතේ රු.23,346,341 ක් වැය කර තිබූ අතර මුළු පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව සකස් නොකිරීම නිසා රු.1,731,756 ක අමතර වැයක් ද, නිසි ලෙස සැලසුම් කිරීම හා අවශ්‍යතා හඳුනා නොගැනීම නිසා රු.146,824 ක අමතර වැයක් ද , නිවැරදි රේටයන් භාවිතා නොකිරීම හා ඉටු නොකළ වැඩ කොටස් සඳහා වැඩිපුර රු.208,274 ක් ද, නියමිත ප්‍රමිතියෙන් වැඩ කොටස් ඉටු කර නොතිබියදී රු.2,143,522 ක් ද සහා අරමුදලෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිසි සැලැස්මකට අනුව නිවැරදිව ඇස්තමේන්තු සකස් කර, නිවැරදි රේටයන් භාවිතා කර ඉටු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ආ) | උක්ත නිල නිවාසය ඉදි කිරීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:3:1 හා 4:3:2 විධිවිධානවලින් බැහැරව නාගරික කොමසාරිස් නිල නිවාසය ඉදිකිරීමේ පළමුවන අදියරයේ දී සකස් කරන ලද රු.12,953,254 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුවේ ඇතුළත් රු.6,266,565 ක් වූ වැඩ විෂයන් 55 ක් ඉටු නොකර අතහැර දමා තිබූ අතර එය මුළු පිරිවැය ඇස්තමේන්තු වැඩ වටිනාකමින් සියයට 48 ක් විය. | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 4:3:1 (ඇ)(ii) විධිවිධාන වලින් බැහැරව උක්ත නිල නිවාසය ඉදි කිරීමේදී සිවිල් වැඩ වටිනාකමින් සියයට 10 උපරිමයකට යටත්ව භෞතික හදිසි අවිනිශ්චිත අවශ්‍යතා සඳහා වෙන් කර තිබූ රු. 1,295,325 ක මුදල ඉක්මවා අමතර වැඩ (Extra work) හා වැඩිපුර වැඩ (Excess work) වෙනුවෙන් රු.7,892,682 ක් ගෙවා තිබූ අතර එය මුළු ඇස්තමේන්තු වටිනාකමින් සියයට 61 ක් විය. | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාළ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 හා සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභා සීමාව තුළ පිහිටි ඇල මාර්ග පවිත්‍ර කිරීමේ දී අනුමත මිල රේටයන්ට වඩා වැඩිපුර රු.990,520 ක් ගෙවා තිබුණු අතර ඇල මාර්ග පවිත්‍ර කිරීම සඳහා විධිමත් වැඩසටහනක් හා ඇස්තමේන්තුවක් සකස් කර පිරිවැය අවම වන පරිදි ගිවිසුම්වලට එළඹීමෙන් තොරව කුලී පදනම මත පොන්ටූනයක් ලබා ගෙන තිබූ අතර සභාව සතු අංක JCB-8040 එක්ස්කැවේටර් යන්ත්‍රය යොදවා නොගෙන ඒ සඳහා රු.1584710ක අමතර පිරිවැයක් දරා තිබුණි. | වැඩ නිම වූ පසු ලබා ගත් මිනුම් අනුව වාරිමාර්ග රේටයන් භාවිතා කර ඉටු කළ වැඩ ප්‍රමාණයට ගෙවීම් කර ඇති බවත්, සභාව සතු එක්ස්කැවේටර් යන්ත්‍රය යොදවා ඇල මාර්ග පවිත්‍ර කිරීමට | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විශාල ප්‍රමාණයේ බාජ් උපකරණයක් යොදා ගත යුතු බවත් ඒවා ඇල මාර්ගවල හැසිරවීමට සිදු කළ නොහැකි බව. | |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------- |
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාලසීමාව අවුරුදු 05 ක් එකම තනතුරේ/එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා වහාම ස්ථාන මාරු ලබා දිය යුතුව ඇති නමුත් එවැනි නිලධාරීන් 13 දෙනෙකු වර්ෂ 05 කට වැඩි කාල සීමාවක සිට සභාවේ සේවය කරමින් සිටින බවට දක්නට ලැබුණි. | ස්ථාන මාරු ඉල්ලුම් කළද එය නොලැබීම, අනුප්‍රාප්තිකයන් නොමැති වීම, විශ්‍රාම යෑම හා අධි ශ්‍රේණියට පත්වීම ආදී කරුණු ස්ථාන මාරු නොවීමට හේතු වූ බව හා කිහිපදෙනෙකුට 2024 වර්ෂයේ ස්ථාන මාරු නියෝග ලැබී ඇති බව | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 12 දෙනෙකුගේ අයවිය යුතු එකතුව රු.130,847 ක් වූ ණය ශේෂ සමලෝචිත වර්ෂය අවසාන වන විටත් අය නොවී පැවතුනි. | ණයකරුවන් 04 දෙනෙකු ණය ශේෂ නිරවුල් කිරීමට කිසිදු ප්‍රතිචාරයක් නොමැති බවත්, ඇතැම් ණයකරුවන්ගේ ඇපකරුවන් විශ්‍රාම ලබා ඇති බවත් අයකර ගත නොහැකි යැයි සනාථ වී ඇති ණයකරුවන් 11 දෙනෙකුගේ රු.49,535 ක් වූ ණය ශේෂ කපා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඇ) | සභාවේ පවතින කණිෂ්ඨ සේවක තනතුරු අටක් වෙනුවෙන් ඇති වී තිබූ පුරප්පාඩු 62 ක් සම්පූර්ණ කිරීමේදී අංක 87.ඉ. 2 (2019/මා.ම.න.ස./මුදල් ප්‍ර.144) දරන 2019 පෙබරවාරි 12 දින සභාවේ සේවය කරන කොන්ත්‍රාත් සේවකයින්ට ප්‍රමුඛතාවය ලබාදෙන බව සඳහන් වුවද බඳවා ගැනීමේ ගැසට් නිවේදනයට එය ඇතුලත් කර නොතිබුණි. | සභා තීරණය අනුව අවසර ලබා දුන්නද, දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කනිෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටිය අනුව "මාතර මහා නගර සභාව තුළ සේවය කරන කොන්ත්‍රාත් සේවකයින්ට ප්‍රමුඛතාවය ලබා දෙන බව" දක්වා විශේෂීකරණයක් කිරීම සුදුසු නොවන බැවින් ගැසට් නිවේදනයේ එසේ යෙදීම සිදු නොකරන ලද බව. | සභා තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගැනීමේදී මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට එක් වසරකට ලකුණු 05 | ලකුණුවල එකතු අතර අසමානතාවය හා ලකුණු සංශෝධනය කිරීමේ දී කෙටි අත්සන් යොදා නොතිබීම අතපසුවීමක් මත සිදුව ඇති | මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් |

| | | | |
|---|---|---|---|
| | බැගින් වසර 09 ක් සඳහා උපරිම ලෙස ලකුණු 45 ලබාදිය යුතු වුවත් මහා නගර සභා බලප්‍රදේශය තුළ පදිංචිය නොසලකා ලකුණු ලබා දීම, පදිංචි සහතික මගින් සනාථ නොකර පදිංචිය සඳහා ලකුණු ලබා දීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වෙන් වෙන් වශයෙන් ලබා දී තිබූ ලකුණුවල එකතුව අවසන් ප්‍රතිඵල සඳහන් මුළු ලකුණු එකතුව සමඟ සැසඳීමේදී අයදුම්කරුවන් 06 දෙනෙකුගේ ලකුණුවල නොගැලපීම, සංශෝධනය කරන ලද ලකුණු සඳහා කෙටි අත්සන් යොදා නොතිබීම හා වයස අවුරුදු 45 ඉක්මවූ මූලික සුදුසුකම් සපුරා නොතිබූ අයදුම්කරුවන් කම්කරු තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ලබා දීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | බවත්,ඒ තුළින් කිසිදු පත්වීම් ලාභියෙකුට අගතියක් සිදුවී නොමැති බවත්, අනු අංක 04,05,18,20,21 හා 29 දක්වා තිබූ අයදුම්කරුවන් 06 දෙනා කොන්ත්‍රාත් පදනම යටතේ මහා නගර සභාවේ සේවයේ යෙදී සිටි බැවින් ඔවුන් කෙරෙහි අවධානය යොමු කර ආණ්ඩුකාරවරගේ අනුමැතියට යටත්ව බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබූ බව. | පමණක් බඳවා ගත යුතුය. |
| (ඉ) | පසුගිය වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති වැඩ අධිකාරී තනතුර සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි 05 දින තාක්ෂණ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේදී 04 වන දින සිට නිලධාරියා විශ්‍රාම යාමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සුදුසුකම්ලත් පුද්ගලයෙකු වැඩ අධිකාරී තනතුරට පත්කර නොතිබුණි. තවද තාක්ෂණ නිලධාරීන් 04 දෙනෙකුට කොට්ඨාශ රාජකාරි පැවරීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ බව නිරීක්ෂණය විය. | අදාළ තනතුර සඳහා තාක්ෂණ සේවයේ සුදුසු නිලධාරිවරයෙකු ලබා දෙන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉල්ලීම් යොමු කිරීමෙන් පසු දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) අනුමැතිය මත 2023 සැප්තැම්බර් 12 දින සිට සතියට දින 02ක් එම තනතුරේ වැඩ බැලීම සඳහා තාක්ෂණ නිලධාරි (සිවිල්) I ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කර තිබූ බවත්, 2024 මාර්තු 21 දින සිට මහා නගර සභාවේ සේවයේ නියුතු තාක්ෂණ සේවයේ (සිවිල්) I ශ්‍රේණියේ නිළධාරියකු පූර්ණ කාලීනව එම තනතුරට පත් කර ඇති බවත්, ජන සනත්වය අනුව තාක්ෂණ සේවා නිලධාරින්ට කොට්ඨාශ රාජකාරි පැවරීම සිදු කර ඇති බව. | තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත නිලධාරයෙකු කඩිනමින් පත් කළ යුතුය. |